**නාරම්මල ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂ 05කට අදාළ රු.28,356,503 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගබඩාව විසින් නිකුත් කිරීමේ වටිනාකම රු.6,093,053 ක් ගබඩා ගිණුමට බැර නොකිරීම හේතුවෙන් ගබඩා ශේෂය වැඩියෙන් සහ සැපයුම් උපකරණ වියදම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර වලින් අයවිය යුතුව රු.37,125 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අදාළව අවසන් වී නොමැති නඩු 04 ක් පැවති අතර ඒ සඳහා රු.29,000 ක් සභා අරමුදලින් වැය දරා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල මෙම නඩු පිළිබඳ විස්තර හෙළිදරව් කර නොතිබුණි. | -එම- | අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 ක ශේෂ එකතුව සහ අදාළ උපලේඛනවල ශේෂ එකතුව අතර රු.458,306 ක වෙනසක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිශ්චිතව තහවුරු කර නොගත් වටිනාකම රු.7,062,262 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙන් ජර්නල් සටහන් 31 මඟින් ඉවත් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |

## 1.7 අනුකූල නොවීම

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වටිනාකම රු.8,691,018 ක් වූ ඉකුත් වූ තැන්පත් 514 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 6.3 වගන්තිය | ධූරාවලියේ එක් එක් තලය සඳහා අනන්‍ය වූ නිපුණතා ඉලක්ක සපුරා ගැනීම යෝජනා කර තිබුණ ද ඒ කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | -එම- | චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) | 6.5 වගන්තිය | මානව සම්පත් සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීම අවම වශයෙන් වසර 02කට වරක් සිදුකළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර එය සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | පිළිගන්නා බව | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) | 59 රීතිය | කර්මාන්ත පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර එම ලැයිස්තුව සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , 2023 වර්ෂයට අදාළව එසේ කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (iii) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 218 රීතිය | රීතිය ප්‍රකාරව පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,623,618 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,131,722 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 11,753 | 11,763 | 11,763 | 2,583 | 12,796 | 17,790 | 12,159 | 5,631 |
| කුලී | 19,520 | 27,657 | 27,629 | 246 | 26,457 | 24,774 | 24,032 | 742 |
| බලපත්‍ර ගාස්තු | 250 | 302 | 302 | - | 1,163 | 1,852 | 1,852 | - |
| වෙනත් ආදායම් | 50,877 | 51,178 | 51,178 | - | 31,296 | 74,513 | 44,663 | 29,850 |
| එකතුව | 82,400 | 90,900 | 90,872 | 2,829 | 71,712 | 118,929 | 82,706 | 31,123 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 5කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කරවාගත යුතු වුව ද ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු තක්සේරුවක් අවසන් වරට සිදුකර තිබුනේ 2015 වර්ෂයේ දී ය. වර්ෂ 05කට වරක් තක්සේරුවක් සිදුනොකිරීම හේතුවෙන් දේපල වල වර්තමාන තත්ත්වය වෙනස්වීම මත නිශ්චිතව ගණනය කළ නොහැකි ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | නිරීක්ෂණය සමහ එකඟ වන බව | බදු තක්සේරුව කාලීනව සිදුකර ආදායම් උත්පාදනය සඳහා කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,766,916 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි. | -එම- | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පොදු වෙළඳ සංකීර්ණයෙහි, නව වෙළඳ සංකීර්ණයෙහි සහ බස් නැවතුම්පොලෙහි කඩ කාමර 01 බැගින් කඩ කාමර 03 ක් වර්ෂය තුළ බදු දී නොතිබුණි. | -එම- | කඩකාමර ටෙන්ඩර් මඟින් ලබා දිය යුතු ය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ආදායම කඩකාමර 149ක රු. 344,086 ක් විය. | -එම- | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.576,272 ක හිඟ ටෙන්ඩර් කුලියක් සභාවට අයවිය යුතුව පැවතුණි. | -එම- | හිඟ ටෙන්ඩර් කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| ( උ) | පූර්ව වර්ෂ 05ක් තුළ දී ලබාගත් ගොඩනැගිලි බලපත්‍ර වලට සාපේක්ෂ ව අනුකූලතා සහතික ලබා ගැනීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. සභාව විසින් අනුකූලතා සහතික ලබා ගැනීමට අදාළ පසුවිපරම් නොකිරීම හේතුවෙන් සභාවට අයවිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | නිරීක්ෂණය සමහ එකඟ වන බව | ආදායම් නිසි ලෙස අයකර ගත යුතු ය. |

| | | |
|---|---|---|
| (උ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.10,364,213 ක් සහ මුද්දර ගාස්තු රු.26,880,000 ක් ලැබිය යුතුව පැවතුණි. | -එම- | මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3 .1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 10 ක වටිනාකම රු.57,370,567 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතු වටිනාකම රු.29,555,936 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු ය. |
| (ඇ) විශ්‍රාම ගිය සහ සේවය හැර ගිය සේවකයින් 07 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.560,069 ක අයවිය යුතු ණය ශේෂයක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතු ය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 12 ක් හා අතිරික්ත කාර්ය මණ්ඩලය 25 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතු වේ. |

## 3.3 නිෂ්කායර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු අඹගම්මන උපකාර්යාල පරිශ්‍රය වසර 13 ක කාලයක සිට සහ පැරණි සභා කාර්යාල ගොඩනැගිල්ල වසර 2 ක කාලයක සිට උපයෝජනයකින් තොරව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2021 වර්ෂයේදී නළ ළිං අළුත්වැඩියාවට භාවිත කරන උපකරණ කට්ටලයක් රු.25,185කට ලබාගෙන තිබුණ ද එම උපකරණ කට්ටලය ඌන උපයෝජිතව පැවතුණි. | -එම- | -එම- |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වීදි පහන් කනු විධිමත් පරිදි අංකනය කර ලේඛනගත කර නොතිබූ අතර සියල්ල දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ආ) | උපකරණ වර්ග 36කට අයත් අයිතම 141 ක වටිනාකම සහ සභාව සතු ඉඩම් 05 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළට හඳුනාගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ඇ) | සභාව සතු නළ ළිං පිහිටි ස්ථාන , නළ ළිංවල ක්‍රියාකාරිත්වය , නඩත්තු සිදුකිරීම් හා භාරකාරිත්වය පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන දඹදෙණිය සතිපොළ සහ දඹදෙණිය පෙරපාසල සහ පුස්තකාලය පිහිටි ඉඩම ,දඹදෙණිය බංගලාවත්ත වෙන්දේසි ඉඩම, දැලිකණු අංග සායන මධ්‍යස්ථාන ඉඩම, ඔලියදෙණිය සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සහ සුසාන භූමිය පිහිටි ඉඩම, කප්තුරා ඉඩම කට්ටි අංක 12, අඹගම්මන උපකාර්යාලය පිහිටි ඉඩම සහ ප්‍රාදේශීය සභා පැරණි කාර්යාල ගොඩනැගිල්ල යන ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟ වන බව | ඉඩම්වල අයිතිය විධිමත් ලෙස සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 27 ක සිට 90 ක් දක්වා විචලනයක් ද වියදම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 47 කට වඩා වැඩි විචලනයක් ද පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වසර මුල ආදායම් හා වියදම් සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර අයවැය ලේඛනය සකස් කළ යුතු වේ. |